අවමානයන් සහ අගෞරවයන් නැවත නැවතත්

බුද්ධි ප්‍රබෝධ කරුණාරත්නගේ මිය යෑම සමගින්, එම සිදුවීම, ඇතැම් මාධ්‍ය මගින් දිවි තොර කරගැනීම් වාර්තා කිරීම පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන් අනුගමනය නොකරමින් පළ කොට තිබිණි.

එසේම, දිනමිණ කතුවැකියක් (අප්‍රේල් 20, 2023) මගින් ද, සිළුමිණ කාටූනයක් (අප්‍රේල් 23, 2023) මගින් ද එම සිදුවීම අවමානයට සහ අගෞරවයට ලක් කරමින් වාර්තා කිරීම් කර තිබූ බව ද Ethics Eye අපි පෙන්වා දී ඇත.

මේ අතර, අප්‍රේල් 23, 2023 දින ද දිනමිණ පුවත්පත, බුද්ධි ප්‍රබෝධගේ මරණය පිළිබඳව ඉඟි කරමින්, අරගලය සම්බන්ධ කරමින් තවත් කතුවැකියක් පළ කරයි.

"අං ඇන්දලාගේ කීබෝඩ් ගාය" යන සිරස්තලයෙන් යුතු එහි, "එහෙව් අසරණයෙක් ඊයෙ පෙරේදා 'වැඩිපුර පෙති බී' ගොඩිගමුවේ සුසානයේදී මිහිදන් විය" යනුවෙන් සඳහන් වේ.

ඔබ සිතන ආකාරයට,

1) දිනමිණ නැවත නැවතත් දිවි තොර කරගැනීමක් සම්බන්ධයෙන් අසංවේදී ලෙස වාර්තා කරන්නේ මන්ද?

2) මෙසේ නැවත නැවතත් මෙම සිදුවීම පිළිබඳව මෙවැනි අන්තර්ගතයන් පළ කිරීම ඔස්සේ, මිය ගිය අයට අවමානයක් සහ අගෞරවයක් නොසිදුවන්නේ ද?

හදිසි උපකාරක අංක:

*CCCline - 1333

* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860

*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# අවමානයන් සහ අගෞරවයන් නැවත නැවතත්

ETHICS EYE

## අං ඇන්දලාගේ කීබෝඩ් ගාය

අද ලෝකය වෙනස් කරන්නේ තරුණ පරපුරයි යන්නේ සිට යන්ග් ජෙනරේෂන් කියනා තැන දක්වා ටෝක්කක් දී, කීබෝඩ් වීරයාට අං තට්ටුවක් දුන් කල්හි ඌ අම්මාට, තාත්තාට ද අනින්නේය. ඒකා අන්තිමේදී නතර වෙන්නේ ඒ අං තට්ටුවෙන් තමාට ද ඇනගෙනය. එහෙව් අසරණයෙක් ඊයේ පෙරේදා 'වැඩිපුර පෙති බී' ගොඩිගමුවේ සුසානයේදී මිහිදන් විය.

දැන් මේ පන්නය ද වඳ වී යෑමේ තර්ජනයට මුහුණ දෙමින් සිටියි. එසේ වුවත් අකුරණ පන්නයේ වැඩ කටයුතු ඉඳහිට එකෙක් දෙන්නෙක් තවමත් කරමින් සිටිති. මේ නිසා ෆේක් ප්‍රොෆයිලයේ සිට, සයිබර් කට කතාකරුවන් මට්ටු කිරීම සඳහා නීතිය බල ගැන්විය යුත්තේය. එකා එකා තනියෙන් සිය මානසික රෝග සමාජයට මුදා හළ විට, ඒ සමාජය පිස්සු වැටෙන්නේ ඉබේටමය. මේ නිසා, අසුවෙන තැනින් පටන් ගෙන මේ ව්‍යාධියට පිළියම් යෙදිය යුත්තේය.

දිනමිණ
The Dinamina

2023-04-25